**ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය යොමුව : 5.4.14**

## ආරවුල් විසඳීම

කොන්ත්‍රාත් ගිවිසුම් තුළින් මතු වන්නාවූ සියලු ආරවුල් ( සාර්ථක ලංසුකරු විදේශිකයකු වන අවස්ථාවක විදේශ අරමුදල් සපයන නියෝජ්‍යායතනයක් විසින් අවශ්‍ය කරනු ලබන්නේ නම් මිසක ) 1995 අංක 11 දරණ බේරුම් කිරීමේ පනතේ විධිවිධානවලට අනුකූලව සිදු කළයුතුය. මෙම විධිවිධාන ක්‍රියාත්මක කිරීම පිණිස වෙනම වගන්තියක් ලංසු කැඳවීමේ ලේඛණවලට මෙන්ම කොන්ත්‍රාත් ගිවිසුමට ද ඇතුලත් කළ යුතුය.

බේරුම් කිරීමේ පනතේ විධිවිධානවලට යටත්ව ජාත්‍යන්තර වෙළඳ මණ්ඩලයේ හෝ ජාත්‍යන්තර වෙළඳ නීතිය පිළිබඳ එක්සත් ජාතීන්ගේ කොමිෂන් සභාවේ බේරුම් නීතිරීති හෝ වෙන යම්කිසි පිළිගත හැකි නීතිරීති කට්ටලයක් භාවිතා කිරීම නිර්දේශ කරනු ලැබේ.

බේරුම් කිරීමේ ස්ථානය බේරුම් කිරීමේ පනතෙහි 16 (1) වගන්තිය අනුකූලව තීරණය කළ යුතුය.